## බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව

## කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

11. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ පෙන්වා දී තිබූ රු.145,986 ක් වූ රාක්ක ඉදිකිරීමට අදාල වියදම නිවැරදි කිරීම සඳහා ජ'නල් 8 මඟින් ගැලපීමේදී ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කරනු වෙනුවට වර්ෂයේ වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් බැරකර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ මිලදීගත් ලැප්ටොප් පරිගණකයක් ප්‍රාග්ධනිත කිරීමට ජ'නල් සටහන් 9 මඟින් සටහන් යෙදීමේදී අදාල වියදම සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ ගිණුමට හර කිරීම නිසා රු.50,100 කින් වර්ෂයේ වියදම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 109,367 ක් ලැබිය යුතු ආදායම් යටතේ සහ ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා ගෙවිය යුතු ණය මුදල රු.1,120,345 ක් වුවත් ණයහිමියන් යටතේ රු.746,897 ක් දක්වා තිබූ නිසා ණයහිමියන් රු. 373,448 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් ඉදිකළ කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු.14,568,509 ක් ණයගැතියන් අඩුවෙන් දක්වා තිබූ අතර රු. 12,347,748 ක ණයහිමියන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම අතර තිබූ රු.203,733 ක වෙනස සොයාබලා ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(උ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් 2015 වර්ෂයට අදාල පොලී මුදල වූ රු. 249,753 ක් වියදම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් එම ප්‍රමාණයෙන් ඌනතාවය අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමි ප්‍රමාණය රු.3,106,790 ක් වුවත් ගිණුම්වල රු.2,668,049 දැක්වීමෙන් රු.438,741 ක් අඩුවෙන් හෙළිදරව් කර තිබුණි.

(එ) 2015 වර්ෂයේ ප්‍රදාන ලෙස ලද වටිනාකම රු.6,000,000 ක් වූ වාහන 03 ක් ගිණුම්ගත නොකිරීමෙන් එම ප්‍රමාණයෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම අඩුවෙන් දක්වා තිබුණු අතර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) ප්‍රාදේශීය සභාවේ රථගාල ඉදිකිරීම සඳහා දරන ලද රු. 77,550 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායම් දායක වීමේ ගිණුමට බැර නොකර වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඔ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ආරක්ෂිත වැට සඳහා ගෙවන ලද රු.219,536 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමක් දායක වීමේ ගිණුමට බැර නොකර වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඕ) ප්‍රාග්ධන වැය යටතේ දැක්විය යුතු වටිනාකම රු.35,188 ක විෂයයන් 3ක් පුනරාවර්තන වැය යටතේ දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම

------------------------------

ගිණුම් විෂයයන් 10 ට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 25,561,239 වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිනුම් ශේෂයන්ගේ එකතුව රු.25,652,100 ක් වූයෙන් වෙනස රු.90,861 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට, ලැබිය යුතු අවුරුදු 03 සිට 06 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 149,861 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 11,346,813 ක් විය.

1.3.4 <u>නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව</u> | <u>අනුකූල නොවීම්</u> |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| මු.රෙ.571 | 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාල රු.6,138,845 ක් වූ කල් ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙම තැන්පත් මුදල තුළ පොදු වෙළඳපල කඩ කාමර පෙර විකුණුම් |

පදනම මත බදු මුදල් වූ රු. 4,757,859 ක් ද වන අතර එම මුදල් කඩ කාමර ඉදි කිරීම සඳහා වැය කර ඇති බවත් එය තැන්පත් ගිණුම හරහා නිරවුල් වී නොමැත් බවත් අනාවරණය විය.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය

(i) 261.2.2 රීතිය

තත්කාර්ය අතුරු අග්‍රිම යටතේ ලබා ගන්නා අත්තිකාරම් අදාල කාර්යය අවසන් වූ වහාම ඉතිරි වූ මුදල එදිනම හෝ ඊළඟ වැඩ කරන දිනයේදී ගෙවිය යුතු වුවද 2012 සැප්තැම්බර් මස සිට රු.69,038 ක මුදලක් පියවා නොතිබුණි.

(ii) 283.4 රීතිය

එකතුව රු.31,769 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 582,054 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායමට වඩා වැඩි වූ වියදම රු 4,513,231 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,095,285 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,095,285 ක වර්ධනයට ආදායම් විෂයයන් 05 ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

(අ) ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2015.01.01 දිනට හිගය රු.000 | 2015.12.31 දිනට හිගයෙන් අයකිරීම රු.000 | 2015 වර්ෂයේ බිල්කිරීම. රු.000 | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම රු.000 | 2015.12.31 දිනට හිගය 2015.01.01 දිනට පැවති හිගයෙන් රු.000 | වර්ෂයේ බිල්කිරීම් වලින් හිගය රු.000 | මුළු හිගය රු.000 |
|---|---|---|---|---|---|---|---|
| i වරිපනම් හා බදු | 183 | 133 | 773 | 645 | 50 | 128 | 178 |
| ii බදු කුලී | - | - | 337 | 337 | - | - | - |
| iii බලපත්‍ර ගාස්තු | - | - | 211 | 211 | - | - | - |
| ivවෙනත් ආදායම් | - | - | - | 1079 | - | - | - |

(ආ) සභාව විසින් ලබාදුන් හිග ආදායමට අනුව වරිපනම් හා බදු වලින් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු. 178,243 ක් වුවත් ගිණුමට අනුව එම ශේෂය රු. 227,303 ක් විය.

2.3.2 වරිපනම් බදු

--------------

සභාවට අයත් වරිපනම් දේපල 2009 වර්ෂයේදී යටියන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරා ගන්නා ලද දේපල වන අතර ඉන්පසු මෙම දේපල නැවත තක්සේරු කිරීමට හා වරිපනම් ගාස්තු සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා.

-------------------------------------

(අ) රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශය මගින් 2015 වර්ෂය සඳහා අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ රු.7,000,000 මුදලක් වෙන්කර තිබුණි. එයින් රු.1,202,899 ක් පමණක් වැයකර තිබුණ අතර රු.5,797,101ක මුදල නිසි පරිදි කළමනාකරණය නොකිරීම මත සභාවට අහිමි වී තිබුණි.

(ආ) බුලත්කොහුපිටිය නගරයේ සතිපොල භූමිය සංවර්ධනය කිරීම සඳහා 2014 ජනවාරි සිට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින දක්වා එම සතිපොල ඉදිකිරීම් නිමකර නොමැති බැවින් සතිපොල පැවැත්වීම සඳහා දිනකටරු.5,000 බැගින් භූමියක් කුලියට ගැනීම සඳහා 2014 හා 2015 වර්ෂ රු. 480,000 ක් කුලී ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩ සටහන යටතේ රු.21,469,814 ක ඇස්තමේන්තුවක් මත ආදාහනාගාරය ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. 2016 අප්‍රේල් 06 දක්වාම ඉදිකිරීම් නිමකර නොතිබීම නිසා ආදාහනාගාරයේ භූමිය ප්‍රයෝජනයට ගැනීම සභාවට අහිමිවී තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ඉදිකරන ලද කර්මාන්ත වලට අදාල පරිපාලන වියදම් ලබාදීමට පෙර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රත්නපුර දිස්ත්‍රික් සමුපකාර බැංකු සංගමයෙන් රු.172,950 ක් වටිනාකම් වූ පරිගණකයක්, වෙබ්

කැමරාවක්,ඩිජිටල් කැමරාවක්, යූපීඑස් එකක් මිලදී ගැනීමට ඇනවුම් කර තිබුණද මුදල් නොලැබීම නිසා 2015 අගෝස්තු මාසයේදී සභා අරමුදලින් ගෙවීම්කර තිබුණි.

(ඉ) 2014 දොරින් දොරට ගමින් ගමට වැඩ සටහන යටතේ ප්‍රාදේශීය සභා කර්මාන්ත 20 ක් සඳහා රු.7,022,666 ක ප්‍රතිපාදන වල භෞතික ප්‍රගතිය 100% වුවද, රු.6,591,802 ක මුදල් ප්‍රතිපූරණය කරවාගෙන නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී පැරණි ගම්සභා උසාවි ගොඩනැගිල්ල නඩු තීන්දුවක් මඟින් අත්පත්කර ගෙන රු.3,180,000 ක වටිනාකම ගිණුම්ගත කර ඇතත් එම වටිනාකම සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබාගෙන නොතිබුණ අතර, එය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) රු.59,700ක්වූ සේවක ඇප තැන්පතු මුදල් එක් එක් නිලධාරීන්ගේ ඉතිරික්රීමේ ගිණුම් පොත්වල තැන්පත් කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයනොවී පැවති එකතුව රු.56,380 ක් වූ සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 ජනවාරි 07 සිට 2015 දෙසැම්බර් 28 දක්වා ටිපර් රථ ආදායම ලෙස රු.260,310 ක් දක්වා තිබුණු අතර ආදායම් රැස්කරන ආකාරය පිළිබඳව ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. ඇතැම් අවස්ථා වල කිලෝ මීටර් ගණනට ගාස්තු අයකර තිබුණ අතර ඇතැම් අවස්ථා වල දෛනික ගාස්තු අයකර තිබුණි.

(ඈ) මානෙල් මල් සංගමයේ සාමාජිකාවන්ට මල්පැල ගෙන ඒම සඳහා වෙන්නප්පුව වැනි ප්‍රදේශ වලට යාමට එක් දිනක් සඳහා සභාව සතු ටිපර් රථයට ලබාදීමට මහ සභාව තීරණය කර තිබුණ අතර එකී තිරණයට ලෙස බස්රථ කුලී ලෙස රු.8,000 ක් ගෙවා තිබුණි.

(ඉ) දෛනික පදනම මත බඳවාගත් ටිපර් රථ රියදුරු සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව දෛනික දීමනාවට අමතරව දිනකට රු.750 බැගින් අවස්ථා 07 කදී රු.5,250 ක් ගෙවීම් කර තිබුණි.

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 මුල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන යාම සභාපතිවරයාගේ කාර්යභාරයක් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 <u>අයවැය පාලනය.</u>

2015 අයවැය ලේඛනය මඟින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන වලින් අවස්ථා 11 කදී එකතුව රු.39,600 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) වත්කම් කළමනාකරණය

(ii) ගිණුම්කරණය

(iii) ආදායම් පරිපාලනය